# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2487/04 - 2026 මැයි මස 04 වැනි සඳුදා - 2026.05.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ**
**ගලිගමුව ප්‍රාදේශීය සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන ගලිගමුව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ගලිගමුව ප්‍රාදේශීය සභාවේ, අංක 8 කොබ්බෑවල කොට්ඨාසයට තේරී පත් වූ හොරතල් පේඩිගේ රුක්ෂාණි මධුෂිකා කරුණාදාස මහත්මිය අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ගලිගමුව ප්‍රාදේශීය සභාවේ අංක අංක 8 කොබ්බෑවල කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ඉඩමෙවත්තෙලාගේ ශ්‍රියානි මංගලිකා ගුණසේන මහත්මිය නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ගලිගමුව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි කරුණාතිලක රාලහාමිලාගේ වසුන්දරා එරන්දි දිසානායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව, ක්‍රියා කරමින් ඉඩමෙවත්තෙලාගේ ශ්‍රියානි මංගලිකා ගුණසේන මහත්මිය, ගලිගමුව ප්‍රාදේශීය සභාවේ, අංක 8 කොබ්බෑවල කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**කේ. ආර්. වසුන්දරා ඊ. දිසානායක,**
තේරීම්භාර නිලධාරි,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2026 අප්‍රේල් මස 30 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කෑගල්ල.

EOG 04 - 0253